# සුනාමිය පිටුපස එන ඇමරිකන් සුනාමිය

සුනාමිය නිසා මෙරට සංස්කෘතිය ගැන ද අවබෝධයක් ලැබිය හැකි නමුත් ඒ ගැන දීර්ඝ විස්තරයක් කිරීම පසුවට කල්තැබීමට සිදුවෙයි. එහෙත් ඉතා කෙටියෙන් කිවයුත්තේ සුනාමි රැල්ල යනුවෙන් දැන් භාවිතා කෙරෙන යෙදුම සිංහල සංස්කෘතියෙහි ලක්ෂණයක් නිස ඇතිවන්නක් බවත් මධ්‍යගත රාජ්‍ය සංවිධානයක් නොමැතිවත් කාර්යක්ෂම ව වැඩකිරීමට සිංහලයන්ට හැකි බවත්, දරදඬු මධ්‍යගත පරිපාලනයකට සිංහලයන් අකමැති බවත් සුනාමියෙන් පෙන්නුම්කරන දෑ අතර වන බව ය. වෙනත් භාෂාවකින් සිංහලයට වචනයක් ගැනීමේ දී ඒ සඳහා සිංහල වචනයක් වේ නම්, අළුත් වචනය ද පැරණි සිංහල වචනය ද එකට යෙදීම සිංහල සම්ප්‍රදායට එකඟ ය. බෝඩි ලෑල්ල, ලයිට් එළිය ආදිය එයට උදාහරණ වෙයි. සුනාමි යන ජපන් වචනයෙහි නාමි යන්නෙන් රැල්ල යන්න කියැවුණ ද අද සිංහලයෙහි සුනාමි හා රැල්ල එකතු වී සුනාමි රැල්ල යනුවෙන් යෙදුමක් සකස් වී ඇත.

මධ්‍යගත පරිපාලනයකට සිංහලයන් අකමැති බව යන්නෙන් අදහස්කරන්නේ සිංහලයන් ඒකීය රාජ්‍යයකට විරුද්ධය යන්න නො වෙයි. පරිපාලනය යන්න එකකි. ව්‍යවස්ථාදායකය යන්න තවත් එකකි. ඒකීය රාජ්‍යය යනු ව්‍යවස්ථාදායකය ලෙස ගත්කල අපේ පැරණි එකසේසත් රාජ්‍යයෙන් වෙනස්වන්නක් නො වෙයි. මුළු රටටම බලපාන පරිදි නීතිය සම්පාදනයකිරීමේ බලය එදා තිබුණේ රජුට හා රාජ සභාවට ය. බ්‍රිතාන්‍ය ඒකීය රාජ්‍යය යටතේ ඒ බලය රජුට හා පාර්ලිමේන්තුවට විය. අපට බ්‍රිතාන්‍යයන්ගෙන් ලැබුණේ අනුකාරක ඇංකරයන් කියන ආකාරයට ඒකීය රාජ්‍යයක් නොව දරදඬු මධ්‍යගත පරිපාලන ව්‍යුහයක් ය. ඒකීය නැත්නම් එකසේසත් රාජ්‍යය පණ්ඩුකාභය රජු දවස සිට සිංහලයන්ට විය. එහෙත් ඔවුන්ට දරදඬු මධ්‍යගත පරිපාලයනක් නො වීය. ඊනියා කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ යටතේ බ්‍රිතාන්‍යයෝ සිංහලයන් සතුව පැවති රාජකාරි ක්‍රමය වටා ගෙතුනු ලිහිල් නම්‍යශීලී පරිපාලනය වෙනුවට දරදඬු මධ්‍යගත පරිපාලනයක් සකස්කළහ. එය සිවිල් සේවකයන්, රාජ්‍ය පරිපාලනයේ නිලධාරීන්, ලිපිකරුවන්, පරිපාලන හා මුදල් රෙගුලාසි, විවිධ චක්‍රලේඛ ඔස්සේ ක්‍රියාත්මක විය. සිංහලයන් එවැනි පරිපාලනයකට කැමති නැත.

සුනාමි ආධාර දීමේ දී සිංහලයන් ක්‍රියාත්මක වූයේ කාගේවත් මධ්‍යගත අණදීමකට යටත් ව නො වෙයි. ජනතා විමුක්ති පෙරමුණේ මැති ඇමතිවරුන්ට ද අද ජනාධිපතිනියගේ ඊනියා උපදෙස් නොමැතිව කටයුතු කිරීමට නොහැකි වුව ද, සාමාන්‍ය ජනයා සුනාමියෙන් විපතට පත්වූවනට ආධාරකිරීමට එළඹුනේ කාගේවත් අණකට නො වෙයි. තමන් අවුරුදු දහස් ගණනක් තිස්සේ පුරුදු ව සිටි පරිපාලන රටාවක් අනුව ඔවුහු එවේලේ ක්‍රියාත්මක වූහ. එය ඉතා කාර්යක්ෂම ව කෙරුණු බව ද අමතක නොකළ යුතු ය. එහෙත් රාජ්‍ය පරිපාලන යන්ත්‍රය එලෙස කාර්යක්ෂම ව ක්‍රියාත්මක නොවී ය. බ්‍රිතාන්‍යයන් අපට උරුමකර දී ගිය රාජ්‍ය පරිපාලනය අද කඩා වැටෙන්නට ආසන්න ය. එය ද සිංහලයන්ගේ සංස්කෘතික ආකල්ප නිසා සිදුවන්නක් වෙයි. බ්‍රිතාන්‍ය පරිපාලන රටාවට විරුද්ධ වූ සිංහලයෝ අවසානයේ දී 1970 සමගි පෙරමුණු ආණ්ඩුව හරහා ඒ පරිපාලනයට විරුද්ධව කටයුතු කළහ. දේශපාලන අධිකාරිය එහි ප්‍රතිඵලය විය. පරිපාලනයෙහි ඊනියා දේශපාලනීකරණය අද කෙතරම් දුරදිග ගොස් ඇත්දැයි කිවහොත් අමාත්‍යාංශ ලේකම් පදවි දැරීම ජනාධිපතිනියගේ අභිමතය පරිදි සිදුවෙයි.

මේ පිළිබඳ වැඩිදුර සාකච්ඡාව පසුවට කල්තැබීමට පළමු ඇංකරයන් කරුණු විකෘතකිරීමට ඉඩ ඇති බැවින් ව්‍යවස්ථාදායකය හා රාජ්‍ය පරිපාලනය එකට පටලවා නොගතයුතු බව අවධාරණය කළ යුතු ය. රටට ම බලපාන නීති එක් මධ්‍යස්ථානයකින් සකස් කෙරුණ ද රාජ්‍ය පරිපාලනය ලිහිල් විමධ්‍යගත එකක් විය හැකි ය. අනෙක් අතට ඒ ඒ ප්‍රදේශවලට බලපාන නීති සම්පාදනය විවිධ ඒකකවලට පවරා තිබිය දී රාජ්‍ය පරිපාලනය මධ්‍යගත දරදඬු එකක් විය හැකි ය. අද ඉන්දියාවේ ඇත්තේ සන්ධීය ආකාරයේ රාජ්‍යයකි. එහෙත් එහි රාජ්‍ය පරිපාලනය දරදඬු බ්‍රාහ්මණ සම්ප්‍රදායට ද අනුකූල වූ සිවිල් සේවයක් වටා සකස් වී ඇත. ලංකාවේ බමුණු කුලයට අයත් වූ සිවිල් සේවය අපි කඩාබිඳ දැම්මෙමු. ඒ කඩා බිඳ දැමිය යුතුව තිබිණි. එහෙත් ඒ වෙනුවට අපට අපේ පරිපාලන රටාවක් සකස්කරගැනීමට නොහැකි විය. එහි ප්‍රතිඵලය වී ඇත්තේ අද ජනාධිපතිනියගේ හිතවතුන්ට බලතල ලබාදෙන ව්‍යුහයක් බවට රාජ්‍ය පරිපාලනය ගරා වැටී ඒ අකාර්යක්ෂම වීම ය.

© Prof. Nalin De Silva

මෙයට වඩා බරපතල කරුණක් කෙරෙහි අද අපේ අවධානය යොමු විය යුතු ය. ඒ සුනාමිය පිටුපස එන ඇමරිකන් සුනාමිය ය. මෙවර සුනාමිය ඇතිවූයේ ඉන්දියන් භූ තැටියේත් මියන්මාර උප භූ තැටියේත් සිරස් ගැටුමක් නිසා යැයි භූ විද්‍යාඥයෝ පවසති. මෙරට භූ විද්‍යාඥයන් මෙසේ පළකරන්නේ ඔවුන් අන්තර්ජාලයෙන් හෝ වෙනත් තැනකින් අහුලාගත් මත මිස ඔවුන්ගේ යැයි කිවහැකි මත නොවන බව ද අප අමතක නොකළ යුතු ය. ඒ අතර තවත් මතයක් වෙයි. එනම් ඉන්දියන් භූ තැටිය ඉරිතලා වෙනත් භූ තැටියක් නිර්මානය වීමේ ප්‍රවනතාවක් ඇති වී තිබෙන බව ය. මෙය එතරම් පැහැදිලි නැත. මේ කියන්නේ මියන්මාර උප භූ තැටිය වෙනත් ම භූ තැටියක් බවට පත්වීමට අර අඳින බවක් ද? අපේ භූ විද්‍යාඥයන්ට ඒ පිළිබඳ අධ්‍යයනයක්කිරීමට හැකියැයි මම නොසිතමි. අපේ භූ විද්‍යාඥයන්ට පමණක් නොව දේශපාලන විද්‍යාඥයන්ට ද අන් අයට ද කළ හැක්කේ ඉංගිරිසියෙන් තිබෙන තොරතුරක් සංකල්පයක් මහදැනමුන්තන් සේ සිංහලෙන් කීම පමණ ය. බලය විමධ්‍යගතකිරීම, ස්වයං නිර්ණය ආදිය පමණක් නොව ඉන්ද්‍රජාලික යථාර්ථය වැනි ඇස් බැන්දුම් ද අපට ලැබෙන්නේ බටහිරෙන් ය. පශ්චාත්නූතනවාදී හිස්ටීරියාකාරයන් ද එකතු වී පතුරවන මතයක් නම් මහන්සිවී යටත්විජිතවාදී දැනුම රැස්කළ යුතු බව ය. දැනුම නිර්මානය කළයුතු ය යන්න මේ හිස්ටීරියාකාරයන්ගේ ඔළුවේවත් ඇඟේවත් නැත. කෙසේ වෙතත් අපට හවායි ඊස්ට් වෙස්ට් ආයතනයේ පමණක් නොව හවායි සුනාමි තොරතුරු ජාලයේ ද පිහිට ය. දැන් ඉන් නොනැවතී ඇමරිකානු හමුදාවේ ද පිහිට ය.

සුනාමියෙන් කලබලයට පත් වූ ඇමරිකානු ජනාධිපති හිටපු ජනාධිපතිවරු ඔවුන්ගේ ඇඹණියෝ වොෂිංටනයේ ලංකා තානාපතිකාර්යාලයට ගියහ. එපමණක් නොව ඔවුහු එහි ඇති ලංකාවේ පන්සල්වලට ද ගියහ. ගොස් හාමුදුරුවරුන්ට අතට අත දුන්හ. ඇඹණියෝ ද අතට අත දුන්හ. මොවුන් ලංකාව ගැන මෙතරම් කම්පාවීම අපට ගුණ ද, අගුණ ද?. අපට දැන් ආධාර ලැබෙන්නේ ගුවන්යානා පිටින් ය. හෙට අනිද්දා පවල් ද එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ලේකම් කොෆී අනන් ද ලංකාවට පැමිණීමට නියමිත ය. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ලේකම්ගේ රාජකාරිය ඇමරිකා එක්සත් ජනපදය වෙනුවෙන් කඩේ යෑම ය. ඒ පදවිය ලංකාවට හිමිවීමට ද ඉඩක් ඇත. භාණ්ඩ හා මූල්‍ය වශයෙන් ලැබෙන ආධාර මදිවාට මෙන් හමුදා භටයන් ලෙස මිනිස් ආධාර ද ලැබෙයි.

ඉන්දියාව, තායිලන්තය, මියන්මාරය ආදී රටවල් සුනාමියට දෙන ජාත්‍යන්තර ආධාර ප්‍රතික්ෂේප කළහ. එහෙත් අපට බුෂ්ගේ පිහිට පැතීමට සිදු වී ඇත. පවල්ලා අනන්ලා පමණක් නොව ධනපාලලා ද කිහිප අර්ථයකින් ම සාමදූතයෝ වෙති. කොටි සංවිධානය කෙලින්ම තමන්ට ආධාර ලබාදෙන ලෙස ඉල්ලන්නේ ආධාර ලෙස ආහාර ඇඳුම් බෙහෙත් ආදිය හැරෙන්නට වෙඩි බෙහෙත් ද ලැබෙන බැවින් ද? මුහුදු කොටි සුනාමියෙන් විනාශ වී ඇති නමුත් නැවතත් සංවිධානයවීමට (කිරීමට) නො හැකි ද? කොමිස් සඳහා රට පාවා දෙන්නෝ තනතුරු සඳහා රට පාවා නො දෙත් ද? ඇමරිකන් එක්සත් ජනපදය අප රට ගැන මෙතරම් කම්පාවීම ගැන අපට වැඩිකල් නොගොස් කම්පාවීමට සිදුවනු ඇත. නැගෙනහිර වෙරළේ ඉල්මනයිට් හා අනෙක් සම්පත්වලට වඩා ඇමරිකාවට ලංකාවේ භූගෝලීය පිහිටීම වැදගත් බව අමතක නොකළ යුතු ය. ලංකාවෙන් දකුණට ඇන්ටාර්ටිකාව තෙක් ගොඩබිමක් නැත. අපට අඩුව පැවති සුනාමි තොරතුරු ජාලය නම් දැන් ලැබෙනු ඇත. ඒ සඳහා පුහුණුව ලබාගැනීමට හවායි යෑමට ද කිහිප දෙනකුට අවස්ථාව ලැබෙනු ඇත.

ඇමරිකන් හමුදා භටයන් ගෙන එන්නේ ආධාර නමින් ඇති එඩ්ස් පමණක් නොවන බව තායි වැසියෝ දනිති. අද ඇමරිකන් එක්සත් ජනපදයට ලංකාවේ අවශ්‍ය කුමක් ද? රට ඒකීය රටක් ලෙස පවත්වාගෙන යෑම ද? මේ සියල්ල සම්බන්ධයෙන් ඉන්දියාව දක්වන ප්‍රතිචාරය කුමක් ද? අප කලින් සිතුවේ ඇමරිකාව සොච්චම් මුදලක් ආධාර ලෙස දී අතපිස ගනීවි කියා ය. එසේ වූවා නම් කොපමණ හොඳදැයි සිතෙන නමුත් දැන් කළ හැක්කේ කුමක් ද? ඉන්දියාව, මියන්මාරය වැනි රටවල් සමග එකතු වී අඩුම තරමින් අපට දෙන ආධාර මෙපමණකට සීමාකිරීමට යැයි ඇමරිකාවට හා බටහිරයන්ට කීමට අපට හැකි ද? විපතට පත්වුවනට උපකාර කිරීමට මෙරට ජනයා තව තවත් ඉදිරියට එනු ඇත. අපට නැත්තේ ඔවුන් දිරිමත්කරන සම්බන්ධීකරණ හෝ සමායෝජන ජාලයක් ය. මධ්‍යගත පරිපාලන රටාවකින් තොරව එවැනි ජාලයක් ඇතිකරගැනීම අපහසු කරුණක් නො වෙයි. එහෙත් ඒ සඳහා අවශ්‍ය ශක්තිමත් දේශපාලන නායකත්වයක් අපට නැත. ඒ අපට නැති කෙළේ 1817-18 දී ය.  අනේ කුඹින්නේ තොපටත් රජෙක් ඉන්නේ .. .. ..

© Prof. Nalin De Silva